# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/26 - 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2024.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ (13) වන අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදය යටතේ පුරප්පාඩුවක් පිරවීම**

අංක 19 - බදුල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත්කරන ලද **ලොකුගස්තොට විතාරණගේ චමින්ද විජෙසිරි** මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන නවවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, ඉහත කී පනතේ 64(1) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද ;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 (13)(ආ) අනුව්‍යවස්ථාව යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි මෙම පුරප්පාඩුව පුරවන ලෙස එකී මන්ත්‍රීවරයා තෝරා පත්කර ගන්නා ලද මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(1) වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබූ හෙයින් ද ;

තේරීම්භාර නිලධරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 (13)(ආ) අනුව්‍යවස්ථාවට අනුව හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වන වගන්තිය යටතේ ක්‍රියාකරමින් එකී මැතිවරණ කොට්ඨාසය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස **වාසලතිලක ගෙදර නයන ප්‍රියංකර වාසලතිලක** මහතා තෝරා පත්කරන ලද බව ප්‍රකාශයට පත්කර, එම පනතේ පළමුවන උපලේඛනයේ "ක" ආකෘතිය මත, මැතිවරණ කොමිෂන් සභාවට වාර්තාව ඉදිරිපත් කොට ඇති හෙයින් ද ;

1A - G 41230 — 376 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වන වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඉහත කී ලොකුගස්තොට විතාරණගේ චමින්ද විජේසිරි මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම පිණිස අංක 19 - බදුල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා නවවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස **වාසලතිලක ගෙදර නයන ප්‍රියංකර වාසලතිලක** මහතා තෝරාපත් කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්.ඒ.පී.සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් ෆායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අනුසුයා ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

ඩී. එම්. එස්. එස්. ලක්ෂ්මන් දිසානායක,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 ජනවාරි මස 11 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේදී ය.

EOG 01 - 0097

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.